# 5.1

## සොළොස් මහා ජනපද ව්‍යාප්තිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

මෙම ඒකකය අධ්‍යනය කිරීමෙන් ඔබට පහත දෑ පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත

- සොළොස් මහා ජනපද බිහිවීමට බලපෑ ඓතිහාසික පසුබිම
- සොළොස් මහා ජනපද හඳුනාගැනීම
- සොළොස් මහා ජනපදවල ක්‍රියාත්මක වූ පාලන ක්‍රම
    - රාජාණ්ඩු පාලන ක්‍රමය
    - සමූහාණ්ඩු පාලන ක්‍රමය
- මගධ අධිරාජ්‍යය ප්‍රභවය හා ව්‍යාප්තිය මගධය බලවත් වීමට බලපෑ හේතු

නිපුණතාව :

ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි

නිපුණතා මට්ටම : 5.1

සොළොස් මහා ජනපද පිළිබඳව විස්තර කරයි.

**ඉගෙනුම් ඵල**

- සොළොස් මහා ජනපද පිළිබඳ විස්තර කරයි
- සොළොස් මහා ජනපදවල බලවත් රාජ්‍යය පෙන්වා දෙයි
- සොළොස් මහා ජනපද සිතියමක ලකුණු කරයි

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදූශානි මෙනෙවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සොළොස් මහා ජනපද බිහි වීමට බලපෑ ඓතිහාසික පසුබිම

උත්තර භාරතයේ නව සමාජයක් බිහි විම පිළිබඳ පූර්ණ කථා ප්‍රවෘත්තිය නියමාකාරයට දක්නට ලැබෙන්නේ ක්‍රි.පූ. 6 වන සියවසේ සිට තොරතුරු ගෙන එන බෞද්ධ හා ජෛන සාහිත්‍ය කෘතිවල ය.

ක්‍රි.පූ. 600 සිට මෑතට විහිදෙන වකවානුවේ උතුරු ඉන්දියානු ඉතිහාසය තරමක අනුපිළිවෙළකින් ගොඩනැගිය හැකි ය.

සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායේ බුදුන් වහන්සේගේ කාලයට සමීප වකවානුවේ උතුරු ඉන්දියාවේ පැවති සොළොස් මහා ජනපද නම් වූ රාජ්‍ය සමූහයක් ගැන සඳහන් වේ.

බෞද්ධ සාහිත්‍යයේ සෙසු කොටස්වල එන තොරතුරු ද එක්ව ගෙන හඳාරන කල ඉහත වකවානුවේ උතුරු ඉන්දියාවේ ප්‍රබල සමාජ හා ආර්ථික විපර්යාසයක ලක්ෂණ ඉස්මතු වූ එකක් ලෙස ගත හැකි ය. එය ගෝත්‍රික ආධිපත්‍යයෙන් මිදුණු උත්තර භාරතිය සමාජය රජුන් මුල් කරගත් රාජාණ්ඩු ක්‍රමයක් කරා ගමන් කළ පරිච්ඡේදයකි.

ක්‍රි.පූ.600 වන විට සොළොස් මහා ජනපද තිබුණි නම් ඒවායේ හැඩ ගැසිම ඊට සෑහෙන තරම් ඈත වකවානුවක සිට සිදුවෙමින් පැවතුණේ යැයි සිතිය හැකිය. එහෙත් පශ්වාද් වෛදික සාහිත්‍යයෙන් ලැබෙන තොරතුරු හැර වෙනත් තොරතුරක් ලැබෙන මූලාශ්‍ර නැත.

බෞද්ධ සාහිත්‍යයේ එන තොරතුරු අනුව ක්‍රි.පූ. 6 වන සියවස වන විට ගංගා නදී නිම්නයේ පැවතුණු සමාජයේ කැපී පෙනුණු කොටස් දෙකක් විය.එනම් නිදහස් ගොවින් හා වෙළෙඳුන් ය.

ගංගා නිම්නයේ නැගෙනහිරින් වූ තොටුපළවල් ආශ්‍රිත කුඩා නගරවල සෙට්ටි හෙවත් ශ්‍රේෂ්ඨීන් නමින් හැඳින්වුණු පුද්ගලයෝ වැදගත් තැනක් ගත්හ.

මේ කාල වකවානුව වනවිට “ගහපති“ යන්න ඕනෑ ම කුලයකට අයත් ධනවාදි පුද්ගලයන් හැඳින්වීම සඳහා යොදනු දක්නට ලැබේ. ඔහුගේ ධනවත්කම වෙළෙඳාමෙන්, කෘෂිකර්මයෙන් කර්මාන්ත ශිල්ප වැනි වෙනත් මාර්ගයකින් ලැබූ එකක් විය හැකි ය.

ගෝත්‍රය ප්‍රධාන සමාජ ඒකකය නොවුව ද පරම්පරාව දැක්වීමේ දී එය වැදගත් වූ බවට සාධක ඇත. වෛදික හා පශ්වාද් වෛදික යුගවල දී දක්නට ලැබුණ සංග්‍රාමය තව දුරටත් අවශ්‍යතාවක් නොවි ය.

ඉඩම් කර්මාන්ත හා වෙළෙඳාම මුල් කර ගෙන නැගි එන නව සමාජ කොටස්වල අවශ්‍යතාව වූයේ සිය කටයුතු රිසි සේ ගෙන යාමට අවශ්‍ය පසුබිමක් සපයන නව සමාජයකි. මෙවන් සමාජයක සාරධර්ම සඳහා “ජාති“ , “කුල” වැනි පටු සීමාවන්ට නව අර්ථකථන සැපයූ ප්‍රධාන ආගම් කර්තෘවරුන් පහළ විම ද මෙකල විශේෂිත ය.

නව උත්තර භාරත සමාජයේ අතිශය වැදගත් අවශ්‍යතාව පටු සීමාවන්ගෙන් මිදුණ දේශපාලන තන්ත්‍රයකි. මේ දේශපාලන තන්ත්‍රය සකස් වීම පිළිබඳ පැහැදිලි තොරතුරු නැතත් විවිධ මූලාශ්‍ර අනුව ඒවා නම් වශයෙන් හැඳින ගත හැකි ය. මේවාට පොදු වූ නමක් විය.එනම් සොළොස් මහා ජනපද යන්න ය.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනෙවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ඉහත තොරතුරු පිළිබඳ විමර්ශනය කිරීමේ දී සොළොස් මහා ජනපද බිහි වීමට බලපෑ ඓතිහාසික පසුබිම පහත දැක්වෙන ආකාරයට කෙටියෙන් හඳුනා ගත හැකි ය.

පශ්චාද් වෛදික යුගයේ අවසානය වන විට ආර්යයන් ගංගා නම් ගං නිම්නයේ විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වීම.

එහි දී ස්ථිර ජනවාස ගොඩනගා ඒවායේ ගෝත්‍රිකත්වය ඉක්මවූ ස්ථාවර පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාව මතුවීම.

එසේ ස්ථාවරත්වයට පත් වීමේ දී දුර්වල ගෝත්‍ර යටපත් කර ප්‍රබල ගෝත්‍ර ඉස්මතු වී පසුව ඒවා මහා ජනපද තෙක් විකාශනය වීම.

එසේ පුළුල් දේශපාලන ඒකක ගොඩ නැඟීමට උතුරු ඉන්දියාවේ භූගෝලීය පසුබිම ඉවහල් වීම.

උතුරු ඉන්දියාවේ පැවති වටිනා ආර්ථික සම්පත් රැසක් භාවිතයට ගැනීම.

කෘෂි හා වාණිජ කටයුතුවලින් ධනවත් වූ සමකාලීන සමාජයට ස්ථාවර දේශපාලන ඒකකයන්හි අවශ්‍යතාව දැඩි ව දැනීම.

ඒ අනුව ක්‍රි. පූ. 6 වන සියවස වන විට උතුරු ඉන්දියාවේ ස්ථාවර දේශපාලන ඒකක දහසයක් ඉස්මතු වීම.





අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනෙවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සොළොස් මහා ජනපද හඳුනා ගැනීම

බෞද්ධ ජෛන හා වෙනත් සාහිත්‍ය මූලාශ්‍ර සඳහන් තොරතුරු මගින් වැදගත් ජනපද දහසයක් හඳුනා ගත හැකි ය.

**අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේදි, වත්ස, කුරු, පංචාල, අස්මක, මත්ස්‍ය, සුරසේන, අවන්ති, ගන්ධාර, කාම්බෝජ**




### 01 අංග ජනපදය

අඟු රට යනුවෙන් ද හඳුන්වා ඇත. අගනුවර චම්පා නගරය යි. ඉන්දියාවේ නැගෙනහිර සීමාවට ආසන්න ව රාජ් මහල් කඳු ආශ්‍රිත ව පිහිටියේ ය.(වර්තමාන බිහාරයේ භගපූර් අසල යැයි සොයාගෙන ඇත.) භගල්පූර් සහ මොංගිර් යන දිස්ත්‍රික්ක දෙක එකල අංග රටට අයත් ව තිබූ භූමියක් ලෙස සැලකේ. නිරන්තරයෙන් ම මගධ රජුන්ගේ ආක්‍රමණයට ලක් විය. පසු කලක මගධයේ බිම්බිසාර රජු විසින් මගධයට ඈඳා ගන්නා ලදි.

### 02 මගධ ජනපදය

මෙහි අගනුවර අවස්ථා තුනක දී වෙනස් විය. එනම් ගිරිව්‍රජ, ( එය පර්වත පහකින් වට වී තිබුණි.)රාජගෘහ (රජගහනුවර) පාඨලිපුත්‍ර වශයෙනි. මගධයේ මුල් ම රාජවංශය බෘහද්‍රථ යනුවෙන් පුරාණ ග්‍රන්ථවල දැක්වේ.

### 03 කාසි ජනපදය

ගංගා නදිය අසබඩ පිහිටි ජනපදයකි. එහි අගනුවර වූයේ වාරණාසී යන නමින් හඳුන්වන බරණැස් නගරය යි.කාසි ජනපදයට ඉතා ඉහළ ආර්ථික වටිනාකමක් හිමිව තිබුණි. බරණැස් රජුවරුන් තම දේශය අවට පිහිටි කෝසල, අංග, මගධ යන රාජ්‍ය අල්ලා ගැනීමට කළ උත්සාහයක් ගැනත්, වෙනත් රජවරුන් මහත් ධන ධාන්‍ය ආදියෙන් පිරි සමෘද්ධිමත් බරණැස් නගරය අල්ලා ගැනීමට කළ උත්සාහයක් ගැනත් පැරණි පොත පතේ සඳහන් වේ.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනෙවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනෙවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

04

## කෝසල ජනපදය

කොසොල් රට යනුවෙන් ද හැඳින්විය. පැරණි ග්‍රන්ථවල සඳහන් වන ආකාරයට සරභූ ගංගාවේ දෙපසින් ශ්‍රාවස්තිය අගනුවර කරගත් උත්තර කෝසලය හා කුසාවතී අගනුවර කරගත් දක්ෂිණ කෝසලය නම් රාජ්‍ය කොටස් දෙකක් විය. ශ්‍රාවස්තිය යනු සැවැත් නුවර යි. ප්‍රසේනජිත් කොසොල් රජු විසින් මෙය ප්‍රබල රාජ්‍යයක් බවට පත් කරන ලදි.

05

## වජ්ජි ජනපදය

වෘජි යන නාමයෙන් ද හැඳින්වූ මෙම ජනපදයට ගංගා නදියේ සිට උතුරේ නේපල කඳුවැටිය දක්වා භූමිය අයත්ව තිබුණි. අගනුවර වේසාලි ය .මෙහි සමූහාණ්ඩු පාලනයක් ක්‍රියාත්මක විය.
පසු කාලයක මගධයේ රජතුමා විසින් වජ්ජි ප්‍රදේශය තම දේශයට ඈදා ගන්නා ලදි.

06

## මල්ල ජනපදය

වර්තමාන ගොරක්පූර් ප්‍රදේශය ඊට අයත් වී යැයි සැලකේ. මහා භාරත සමයේ උතුරු මල්ල සහ දකුණු මල්ල යනුවෙන් ද ප්‍රාන්ත කොටස් දෙකක් තිබූ බවත් ඊට පසු ඒ දෙක පිළිවෙළින් කුසිනාරා හා පාවා යන අගනුවර කරගෙන පැවතියේ යැයි සොයාගෙන ඇත. වර්තමාන ගොරක්පූර්හි කාසියා නම් ග්‍රාමය කුසිනාරා නුවර ලෙසත් ඊට කිලෝ මීටර් 20ක් පමණ දකුණු දෙසින් පිහිටි පර්දෝන් ග්‍රාමය පාවා නුවර ලෙසත් විද්වත් ඇලෙක්සැන්ඩර් කනිංහැම් තම ගවේෂණ අවසානයේ දක්වා ඇත.

07

## චේදි ජනපදය

මෙම ජනපදය කුරු සහ වත්ස්‍ය යන ජනපද දෙකට මැදින් පිහිටා තිබුණි.මෙහි අගනුවර සොත්ථිමති විය. මෙය වර්තමාන එක්සත් ප්‍රදේශයේ බණ්ඩා ග්‍රාමය තිබෙන තැන පැවතිනැයි විද්වත්හු කියති. චේද රජවරුන් පිළිබඳව ඍග්වේදයේ ද සඳහන් වන බැවින් ඔවුන් ඉතා පෞරාණික ආර්ය රජ පෙළපතකට අයත් බව පෙනේ.

08

## වත්ස ජනපදය

වංශ යන නමින් ද හැඳින්වුන මේ ජනපදය වර්තමාන යමුනා නදිය අසබඩ අවන්ති දෙසට ඊසාන දෙසින් පිහිටියේ ය. එම නදී තෙර පිහිටි කෞෂම්භි හෙවත් කොසඹෑ නුවර එහි අගනුවර විය. වර්තමාන අලහබාද්හි කෝසම් එම කොසඹෑ නුවර ලෙස හඳුනා ගෙන ඇත.
මෙම නුවර රජකම් කළ කැපී පෙනෙන පාලකයා වූයේ උදයන රජු ය.

09

## කුරු ජනපදය

මෙම ජනපදයට වර්තමාන දිල්ලිය හා ඒ අවට ඇති ඉන්ද්‍ර ප්‍රස්ථ නම් පෙදෙස අයත් විය. පුරාණ සාහිත්‍යයේ මෙය හැඳින්වූයේ ඉදිපත් රට යනුවෙනි. ඉන්ද්‍ර ප්‍රස්ථය හෙවත් ඉදිපත් නුවර අගනුවර කරගත් මෙහි බුද්ධකාලීන පාලකයා කෞරව්‍ය නම් විය.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදූශානි මෙනෙවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

10

## පංචාල ජනපදය

පංචාල ජනපදයේ භූමියට වර්තමාන චම්බාල් නදියේ සිට හිමාල කඳු වැටියේ පාමුල දක්වා වූ පෙදෙස අයත් වි යැයි හඳුනා ගෙන ඇත.මේ ජනපදය ගංගා නදියේ දෙපසින් උතුරු පංචාලය සහ දකුණු පංචාලය යනුවෙන් කොටස් දෙකක් සේ පැවත ඇත.
අහිච්ජත හෙවත් වර්තමාන බර්ලි පළාතේ රාම්නගර් උතුරු පංචාලයේ අගනුවර වූ අතර කම්පිල්‍ය නුවර දකුණු පංචාලයේ අගනුවර විය.
චූලනි බ්‍රහ්මදත්ත රජතුමා මේ ජනපදයේ රජකම් කළ රජකු සේ දැක්වේ. මුලින් රාජාණ්ඩුවක් සේ පැවතුන පංචාලය පසුව සමුහාණ්ඩුවක් වූ බව පෙනේ.

11

## මත්ස්‍ය ජනපදය

උත්තර ප්‍රදේශයේ චම්භාල් සහ සරස්වති යන නදි අතර පිහිටි භූමිය මීට අයත් විය. අගනුවර මධුරා නගරය යි.

12

## සුරසේන ජනපදය

මෙම ජනපදය යමුනා නදී නිම්නයේ එම නදීබඩ පිහිටා තිබුණි.එහි අගනුවර මථුරා නම් විය. අවන්ති පුත්‍ර නම් පාලකයකු විසින් පාලනය කරන ලදි.

13

## අස්මක ජනපදය

පැරණි ඉන්දියාවේ අස්මක යන නමින් ප්‍රදේශ දෙකක් තිබු බැව් පෙනේ. ඉන්දු නිම්නයේ පිහිටි “අස්සකනෝයි” යනුවෙන් ග්‍රීකයන් විසින් හඳුන්වන ලද ප්‍රදේශයේ සහ බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙන මධ්‍ය ප්‍රදේශයේ ගෝදාවරි නදීබඩ පිහිටි අස්මක දේශයේ යන ඒවායි.
විද්වතුන් වැඩි දෙනෙකුගේ පිළිගැන්ම මෙම ජනපදය ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශයේ එනම් ඉන්දු නදි නිම්නයේ ඉහළ පිහිටා තිබු බවයි.
එවකට එහි අගනුවර පොඨලි වර්තමාන බෝදාන් යැයි අනුමාන කෙරේ. බ්‍රහ්මදත්ත සහ අරුණ යන නම්වලින් හැඳින්වන අස්මක රජවරුන් දෙදෙනෙකු ගැන පැරණි සාහිත්‍යයේ සඳහන් වේ.

14

## අවන්ති ජනපදය

මේ ජනපදයට මධ්‍ය ප්‍රදේශයේ නර්මදා නදීබඩ පිහිටි වර්තමාන මල්වා ප්‍රදේශය සහ නිමාජ් සහ මයියාර් යන ඒ අවට බිම් පෙදෙස් අයත් වි යැයි සැලකේ. වින්දාා කඳුවැටියෙන් දෙකොටසකට බෙදී තිබු අවන්ති දේශයේ උතුරු කොටස් අගනුවර උජ්ජේනි හෙවත් උදේනි වූ අතර දකුණු කොටසේ අගනුවර මහිස්මති විය. මෙය නර්මදා නදිබඩ පිහිටි වර්තමාන මන්ධ්‍යා නුවර ලෙස හඳුනාගෙන ඇත. චන්ඩපජ්ජෝත හා නන්දිවර්ධන අවන්තියේ රජකම් කළ සුප්‍රකට රජුන් දෙදෙනෙකි.

15

## ගන්ධාර ජනපදය

මෙම ජනපදයට අයත් ව තිබු භූමි භාගය ලෙස වර්තමාන පාකිස්ථානයේ පෙෂවෝර් (පුරුෂපුරය) සහ රාවල් පිණ්ඩි දෙපළාත හඳුනා ගෙන ඇත.
මෙම ජනපදය ගැන ඍග්වේදයේත්, බෞද්ධ සාහිත්‍යයෙත් සඳහන් වේ.
තක්ෂිලාව අගනුවර කරගත් මෙහි වැදගත් පාලකයකු වුයේ පුක්කුසාති රජුය.

16

## කාම්බෝජ ජනපදය

ගාන්ධාරයට උතුරින් හිමාලය ආසන්නයේ පිහිටි මෙම රාජ්‍ය පිළිබඳ තොරතුරු සීමිත ය.
මහා භාරත ග්‍රන්ථයේ සඳහන් “රාජපුරය” සහ හියුං සාං නම් චීන සංචාරකයා දක්වන “රජෝරය” කාම්බෝජය යැයි සැලකේ.
වයඹදිග ඉන්දියාවේ හසාර පළාතේ රාජ්වුර් නමින් හැඳින්වෙන වර්තමාන ප්‍රදේශය පැරණි කාම්බෝජයට අයත් භූමිය යැයි විද්වත්හු ප්‍රකාශ කොට ඇත.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනෙවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සොළොස් මහා ජනපදවල ක්‍රියාත්මක වූ පාලන ක්‍රම

### හැඳින්වීම

බෞද්ධ සාහිත්‍යය පරීක්ෂා කරන විට බුදුන් වහන්සේගේ කාලයේ උතුරු ඉන්දියාවේ ජීවත් වූ ස්වාධීන ජන කණ්ඩායම් රාශියක් පිළිබඳ තොරතුරු ලබාගත හැකි ය.

### උදාහරණ

- කපිලවස්තු පුරයේ ශාක්‍යයෝ
- පාවා නුවර හා කුසිනාරාවේ මල්ලයෝ
- වෛසාලියෙහි ලිච්ඡවීහු
- මිථිලාවේ විදේහයෝ
- රාමගාමයේ කෝලියෝ

www.e-thaksalawa.moe.gov.lk

පාණිනි ව්‍යාකරණයෙහි එකල එනම් ඇතැම් උගතුන්ගේ මතය අනුව ක්‍රි. පූ. 6 වෙනි ශතවර්ෂයෙහි, තවත් උගතුන්ගේ අදහස අනුව ක්‍රි. පූ. අටවන ශත වර්ෂයෙහි පැවති රාජ්‍ය කොටස් දෙකකට බෙදා දක්වා ඇත. සංඝ හෝ ගණ නමින් හැඳින්වෙන රාජ්‍ය ලෙස දක්වා ඇත්තේ ශුද්‍රක, මාලාව, අම්බෂ්ඨ හස්තිනායක, ප්‍රකණ්ඩ, මද්‍ර, මද්‍රමන්ත, ආප්‍රිත වසාති , භාග්ග, ශිබි, ආශ්වකායන ය.

මේ රාජ්‍යවලින් රාශියක් ක්‍රි. පූ . 4 වන සියවස තෙක් පැවති බවත් ඇලෙක්සැන්ඩර් වයඹදිග ඉන්දියාව ආක්‍රමණය කරන අවස්ථාවේ දී මේ ගෝත්‍රික රාජ්‍යවලින් බරපතල විරෝධයක් එල්ල වූ බවත් ග්‍රීක ලේඛකයන්ගේ වාර්තාවලින් පෙනේ. පාණිනි ව්‍යාකරණයෙහි ජනපද වශයෙන් හඳුන්වන්නේ රජුන් විසින් පාලනය වූ ප්‍රදේශය ය. ඒවා නම් ගන්ධාර , අවන්ති , කෝසල , උසිනර , විදේහ , මගධ , අංග , හා වංග ය .

විවිධ මූලාශ්‍රවලින් ලැබෙන ඉහත සඳහන් තොරතුරුවලින් පෙනෙන්නේ ක්‍රි.පූ. 6 වන සියවස හෝ ඉන් පෙර වකවානුව වන විට උතුරු ඉන්දියාවේ රාජ්‍ය වශයෙන් හැඳින්විය හැකි ප්‍රදේශ රාශියක් පැවති බව යි. මේ රාජ්‍ය ප්‍රමාණ වශයෙන් පමණක් නොව ඒවායේ පැවති පාලන තන්ත්‍ර වශයෙන් ද වෙනස් විය.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනෙවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ


Copyright © www.e-thaksalawa.moe.gov.lk

### සොළොස් මහා ජනපදවල ක්‍රියාත්මක වූ පාලන ක්‍රම ප්‍රධාන වශයෙන් දෙකකි.

- රාජාණ්ඩු පාලන ක්‍රමය
- සමූහාණ්ඩු පාලන ක්‍රමය

## රාජාණ්ඩු පාලන ක්‍රමය

ක්‍රි.පූ. 6 වන සියවස වන විට ප්‍රධාන රාජ්‍ය 4 ක් රාජාණ්ඩු ලෙස ඉස්මතු විය.




Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනෙවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## රාජාණ්ඩු පාලන ක්‍රමයේ ලක්ෂණ

- ☆ පාලනයේ දී රජු ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.
- ☆ ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන අංශ තුනේ ම බලය රජු සතු වීම.
- ☆ පාලකයා ඒකාධිපතියකු ලෙස ක්‍රියා කරවීමට ඇති අවස්ථාව අවුරාලමින් "මන්ත්‍රිපර්ශාද් " නම් මණ්ඩලය මගින් රජුගේ බලය සීමා කිරීම.
- ☆ චතුරංගනී සේනාව මගින් මෙම රාජ්‍යයන්හි බලය ස්ථාවර කර ගැනීමට ක්‍රියා කිරීම ( ඇත් , අස් , රිය, පාබල )
- ☆ පශ්චාත් වෛදික යුගයේ දී රජුට සහාය වූ නිලධාරි පිරිස මේ යුගය වන විට තව දුරටත් විකාශනය වීම.
- ☆ සම්බන්ධක (විධායක) වෝහාරික (අධිකරණ) සේනානායක (හමුදා ප්‍රධාන) වැනි ඉහළ නිලධාරීන් පිළිබඳ ව සඳහන් වීම.
- ☆ රාජාණ්ඩු පාලකයන් සිය බල ව්‍යාප්තීන්හි දී "මත්ස්‍ය න්‍යාය" ඇතුළු විවිධ දේශපාලන න්‍යාය අනුගමනය කිරීම.
- ☆ ආර්ථික සම්පත් මැනවින් උපයෝජනය කළ දක්ෂ පාලකයන් සෙසු සියලු ජනපද යටපත් කර සිය රාජ්‍යය බලවත් කිරීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සමූහාණ්ඩු පාලන ක්‍රමය

ගණ හා සංඝ යන නම්වලින් ද මෙම පාලන ක්‍රමය හඳුන්වන ලදි. වජ්ජී හා මල්ල ජනපදවල මෙම පාලන ක්‍රම ක්‍රියාත්මක විය.

කතිපයාධිපත්‍යයක් හෝ ප්‍රභූ පන්තියේ ආධිපත්‍යයක් පැවති රාජ්‍යවලින් දෙකක් වන ලිච්ඡවි හෙවත් වජ්ජී මල්ල යන ගණ රාජ්‍ය ගංගා නදී නිම්නයේ උතුරෙන් පැවතුන ද ඒවාට කිසි විටෙක නදී නිම්නය සිසාරා දේශපාලන බලය ව්‍යාප්ත කිරීමට ප්‍රයන්ත දැරූ රාජාණ්ඩුවලට අභියෝග කිරීමේ ශක්තියක් නොවී ය.

වජ්ජී මල්ල ගණ රාජ්‍යවල පැවතුණේ පැරණි ගෝත්‍රික සම්ප්‍රදාය පදනම් කර ගත් පාලන තන්ත්‍රයකි.

ලිච්ඡවින්ගේ ප්‍රධාන මධ්‍යස්ථානය වූ වේසාලියෙහි වූ සණ්ථාර ශාලාව ඔවුන්ගේ පාලන කටයුතු සාකච්ඡා කළ, තීරණය කෙරුණු ප්‍රධාන කේන්ද්‍රස්ථානය විය.

මල්ලයන්ගේ මධ්‍යස්ථාන කීපයක් විය. ප්‍රධාන තැනක් ගත්තේ පාවා නුවර කුසිනාරාව යි.

ගෝත්‍ර කීපයක සන්ධානයක් ලෙස ගත හැකි මල්ල ගණ රාජ්‍යය නිතර ම සටනට සූදානම් හමුදා කණ්ඩායම්වලින් යුක්ත වූවකි .

### ලිච්ඡවී රාජ්‍ය ප්‍රදේශ වැදගත් වීමට හේතු

ඒවා නේපාල ප්‍රදේශයේ සිට ගංගා නදී නිම්නය තෙක් විහිදුණු වෙළෙඳ මාර්ග පාලනය කළ හැකි ස්ථානවල පිහිටා තිබුණි. එසේ ම පහළ ගංගා නිම්නයේ වූ ලෝහ නිධිවලින් ලබාගත් ලෝහ හෝ ඒවායින් තැනුණ භාණ්ඩ, නදියෙන් උතුරේ හිමලයාබද සියලු ප්‍රදේශවලට ගෙන යා හැකි වූයේ මේ මාර්ගවලිනි.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනෙවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

වජ්ජි මල්ල හැරුණු විට බෞද්ධ සාහිත්‍යයේ වෙනත් සමූහාණ්ඩු 9 ක් ගැන සඳහන් වේ.

1. කපිලවස්තුවේ ශාක්‍යයෝ
2. කුසිනාරාවේ හා පාවාහි මල්ලයෝ
3. වෛශාලියේ ලිච්ඡවිහු
4. මිථිලාවේ විදේහයෝ
5. රාම ග්‍රාමයේ කෝලියෝ
6. අල්ලකප්පයේ බුලීහු
7. කේශපුත්තයේ කාලාමයෝ
8. පිප්ඵලි වනයේ මෝරියවරු
9. සුංසුමාරගිරියේ භග්ගයෝ

- මෙම රාජ්‍ය පාලනය වූයේ සෑම ප්‍රදේශයකින් ම තෝරා ගත් නියෝජිතයන්ගෙන් සමන්විත "විධායක" සභාවක් මගින් ය.
- එලෙස පාලකයන් 7707 ක් සිටි බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.
- සප්ත අපරිහානිය ධර්ම නම් ආචාරධර්ම හතක් අනුව ඔවුන්ගේ පාලන ප්‍රතිපත්ති ගොඩනැගී තිබුණි.
- පාලක මණ්ඩලය රැස් වූ ශාලාව "සණ්ථාගාර" නම් විය.
- ප්‍රවේණි පුස්තකය අනුව රාජ්‍යයේ අධිකරණ කටයුතු සිදු කරන ලදි.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. නන්දනී සෙනවිරත්න මිය. ලක්දාස ද මැල් විද්‍යාලය, කුරුණෑගල.
සැකසුම :- එච්. එම්. එච් මදුශානි මෙනෙවිය ජාතික තරුණ සේවා සභාව. ( 2017-2018 )
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk